*සැ. යු.* — 2014.01.31 දින පළ වූ අංක 1,848 දරන ගැසට් පත්‍රයේ I:III, III සහ IV (අ) කොටස් පළ නොවීය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,849 - 2014 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2014.02.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 266 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 268 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 273 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 28 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 පෙබරවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## අක්මීමණ ප්‍රාදේශීය සභාව

අක්මීමණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු තනතුරු හා ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ :-

| *අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 11,730-120 x 10-130 x 10 -145 x 10 - 160 x 12 - රු. 17,600 (PL 1-2006 - A) | 8 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |
| 02 | සෞඛ්‍ය කම්කරු | 06 | රු. 11,730-120 x 10-130 x 10 -145 x 10 - 160 x 12 - රු. 17,600 (PL 1-2006 - A) | 8 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| 03 | ආදාහනාගාර සහායක | 01 | රු. 11,730-120 x 10-130 x 10 -145 x 10 - 160 x 12 - රු. 17,600 (PL 1-2006 - A) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

I. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
II. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
IV. අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
VI. අක්මීමණ ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධව වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
VII. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
VIII. රජයේ/පළාත් පාලන හා සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය./විශ්‍රාම වැටුප් සහිත ය.
II. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
III. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.
IV. මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝගවලට ද මධ්‍යම රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවක කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළු සේවකයින් බැඳී සිටිය යුතු ය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය .:*

I. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

II. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් සහතික සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යː-

(i) ජාතික හැඳුනුම්පත ;
(ii) උප්පැන්න සහතිකය ;
(iii) අධ්‍යාපන සහතික ;
(iv) පදිංචිය සහතික කිරීම පිණිස ග්‍රාම සේවා නිලධාරිගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තැබිය යුතු ය ;
(v) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(vi) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකයක් තිබේ නම් එම සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අයුරු :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවර පැහැදිලිව සඳහන් කර 2014.03.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, අක්මීමණ ප්‍රාදේශීය සභාව, පින්නදූව, වලහන්දූව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය.)

07. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල අක්මීමණ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතුය.

අනිල් ප්‍රියදර්ශන ජාගොඩ.
සභාපති,
අක්මීමණ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ ජනවාරි මස 21 වැනි දින,
අක්මීමණ,
අක්මීමණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අක්මීමණ ප්‍රාදේශීය සභාව**

**.......................................*තනතුර සඳහා අයදුම් පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————
   මුලකුරුවලින් හැඳින්වෙන නම:——————————
2. ස්ථිර ලිපිනය :——————————
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————
4. උපන් දිනය : වර්ෂය:———— මාසය:———— දිනය :————
5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු :———— මාස:———— දින:————
6. විවාහක/අවිවාහක බව:——————————
7. ස්ත්‍රී පුරුෂ භාවය:——————————
8. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————
10. අධ්‍යාපන සුදුසුකම් :——————————
11. වෘත්තීය සුදුසුකම් :——————————
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් -

    (i) දැනට දරන තනතුර :——————————
    (ii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත ද :——————————
    (iii) එම තනතුරට පත් වූ දිනය :——————————

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මා මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර/පසුව අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

...............................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ .....................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරනු ඇත. ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————

02-209

# පළාත් පාලන නිවේදන

## බණ්ඩාරවෙල මහ නගර සභාව

ගෝ ඝාතක ආඥාපනත යටතේ කරනු ලබන නිවේදනයයි

ගෝ ඝාතක ආඥාපනතේ 13(1) (අ) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරි තැනවන බණ්ඩාරවෙල මහා නගර සභාවේ නගරාධිපති එල්. ඩබ්ලිව්. චමින්ද විජේසිරි වන මම 2014 වර්ෂයේ බණ්ඩාරවෙල මහ නගර සභා සීමාව තුල පිහිටි මෙහි පහත උපලේඛනයේ සඳහන් වන දිනයන්හි දී මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළෙඳාම් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

එල්. ඩබ්ලිව්. චමින්ද විජේසිරි,
නගරාධිපති,
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2014 ජනවාරි මස 02 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | |
|---|---|
| 2014 ජනවාරි 14 | දෙමළ තෛපොංගල් දිනය |
| 2014 ජනවාරි 15 | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2014 පෙබරවාරි 04 | ජාතික නිදහස් දිනය |
| 2014 පෙබරවාරි 14 | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 පෙබරවාරි 27 | මහා සිව රාත්‍රී දිනය |
| 2014 මාර්තු 16 | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 අප්‍රේල් 13 | සිංහල හා දෙමල අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 2014 අප්‍රේල් 14 | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 2014 අප්‍රේල් 14 | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 මැයි 14 | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 මැයි 15 | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 2014 ජුනි 12 | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 ජූලි 12 | ඇසල පුර පසළොස්වක පෝය දිනය |
| 2014 අගෝස්තු 10 | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2014 සැප්තැම්බර් 08 | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2014 ඔක්තෝබර් 04 | ලෝක සත්ව දිනය |
| 2014 ඔක්තෝබර් 08 | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 ඔක්තෝබර් 22 | දීපවාලී උත්සව දිනය |
| 2014 නොවැම්බර් 06 | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 දෙසැම්බර් 06 | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

02-19

---

## කුරුවිට ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා එළු හා කුකුල් මස් වෙළෙඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය විසින් පහත සඳහන් ස්ථානයෙහි එළුමස් හා කුකුල්මස් වෙළෙඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝ ඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 (දහ හතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි උපලේඛනයෙහි සඳහන් ඉල්ලුම්කරු වෙත අදාළ ව්‍යාපාර ස්ථානයෙහි වෙළෙඳාම කරගෙන යාම සඳහා 2014.12.31 දක්වා බලපත්‍ර ලබාදීම කරන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2013 ජනවාරි මස 10 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළෙඳාම් කරන ස්ථානය* | *වෙළෙඳාමේ ස්වභාවය* |
|---|---|---|
| 1. එස්. ආර්. සී. සේනාධීර මයා 96ඒ, පරණපාර ඉඩංගොඩ, කිරිඇල්ල | කිරිඇල්ල පොදු වෙළෙඳ සැල | එළු හා කුකුළු මස් |

02-71/1

---

## කුරුවිට ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 අධිකාරය)

2013 දෙසැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 4(ආ) කොටසේ පළ වූ පහත උපලේඛනයේ සඳහන් ගෝඝාතකාගාරය සඳහා බලපත්‍ර ලබාදීමට විරෝධතා කැඳවුව ද අදාළ කාලසීමාව තුළ විරෝධතා කිසිවක් නොවූයෙන් අදාළ ඉල්ලුම්කරු වෙත එම බලපත්‍ර 2014 දෙසැම්බර් මස 31 දක්වා ලබාදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2014 ජනවාරි මස 17 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුවන්ගේ නම සහ ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|
| 01. එම්. ඒ. රහුමාන් මයා, අංක 466/සී/35/1, තලාවිටියවත්ත, උඩහගම, ඇහැළියගොඩ. | තලාවිටියවත්ත, ඇහැළියගොඩ. |

02-71/2

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්ති ප්‍රකාරව දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනය දක්වා ඇති මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.10.22 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගවලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාලසීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 16 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
දික්වැල්ල.

*උපලේඛනය*

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගයේ දිග මීටර්* | *මාර්ගයේ පළල මීටර්* |
|---|---|---|---|---|---|
| 01 | ඒ. ටී. ආරියරත්න මාවත | දික්වැල්ල මාතර ප්‍රධාන මාර්ගයේ පුංචිවැව මැද පාර | ආරපොත පාර | 225 | 4.4 |
| 02 | ප්‍රේමරතන නාහිමි මාවත | ශ්‍රමදාන මාවත | සැමි හෙට්ටිආරච්චි මහතාගේ ඉඩම | 500 | 3 |
| 03 | වෙල්ලප්පුලි මාවත | රත්මලේ පාර | නාලක මහතාගේ ඉඩම | 600 | 2.7 |
| 04 | චන්ද්‍රාලෝක මාවත | බෙලිවත්ත සුධර්මාශ්‍රමය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය | ඩී. පී. එම්. ශ්‍රියාකාන්ති මහත්මියගේ ඉඩම | 182 | 3.1 |

02-82

---

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.11.28 අංක 06 දරන සභා සම්මුතිය අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මෙම මාර්ගයට අදාළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුල දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2014 ජනවාරි මස 08 වැනි දින,
මහනගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම්පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | බදුල්ල දුම්රිය පොල පාර අතුරු මාර්ගය | දුම්රියපොල පාර | 114/15 | 116,114/4,114/5,114/12 114/24 | 114/1,61,114/15 114/15ඒ/114/17 | 81.5 | 3.00 |

02-44

---

## මුලටියන ප්‍රාදේශීය සභාව

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වෙනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය සභාව විසින් 2014 ජනවාරි මස 16 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ සම්මුති අංක 17 අනුව මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් මාර්ග මුලටියන ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කිරීමට සුදුසු බවට තීරණය කරන ලදී.

මේ පිළිබඳව මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු ජනතාව විසින් එම මාර්ගයන්ට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24(2) වැනි වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
මුලටියන.

2014 ජනවාරි මස 16 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය අංක 01**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | මුරුතවෙල හරහා මාරමණ්ඩිය මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | එස්. ඩබ්. ප්‍රියන්ත මහතාගේ තැන්නහේන ඉඩම |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | කේ. ජී. අමරසේන මාරමණ්ඩිය ඉඩම |
| මාර්ගයේ දිග | :- | මීටර් 1,505 |
| මාර්ගයේ පළල | :- | අඩි 22 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරි වසම් | :- | ගල්ඇටුඹ/නෙරලම්පිටිය |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණුපස පිහිටි ඉඩම්* |
|---|---|
| එගොඩ මහගෙදර වත්ත | තැන්නහේන |
| මුරුතවෙල වත්ත | මුරුතවෙලහේන |
| බාදුරාවත්ත | අක්කර 15 ඉඩම |
| දෙණියහේන | බාදුරාවත්ත |
| රිසිවේෂම | දෙනියහේන |
| රණසිංහගෙවත්ත | රණසිංහදෙනිය කුඹුර |
| කන්දෙගෙවත්ත | රණසිංහවත්ත |
| | කන්දෙගෙවත්ත |
| | මාරමණ්ඩිය විද්‍යාලය |
| | මාරමණ්ඩිය |
| | රණසිංහවත්ත |
| | මාරමණ්ඩියහේන |

02-78

## වීථි නම් කිරීමේ නිවේදනය

බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ යෝජිත නාමය යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් යෝජනා සම්මුතිය සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය ප්‍රකාරව ගරු පළාත් පාලන මහ අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මින් නිවේදනය කරමි.

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 17 වැනි දින දී ය.

උපලේඛනය

| | *විස්තරය* | *යෝජිත නම* |
|---|---|---|
| 01. | වතුගෙදර හීනටිය පාරෙන් ආරම්භ වි වින්තන උයන දක්වා යන මාර්ගය | දමල් ප්‍රියංකර මාවත |
| 02. | බලපිටිය ප්‍රාදේශීය සභාවේ හිටපු උප සභාපති අජන්ත ගුණරත්න මහතාගේ නිවස දෙසට යන මාර්ගය | අජන්ත ගුණරත්න මාවත |
| 03. | බලපිටිය ගරුමුණි වලව්වට යන මාර්ගය | රාජ නීතිඥ එච්. ශ්‍රී නිශ්ශංක මාවත |
| 04. | ඇල්පිටිය අම්බලන්ගොඩ ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන කැපූ ඇල මංසන්ධිය ඉදිරිපිට මහා චෛතිය පුරාණ විහාරය අසලින් (සමුපකාර ගොඩනැගිල්ල අසලින්) යන මාර්ගය | පූජ්‍ය රන්දොඹේ අමරවංශ නාහිමි මාවත |
| 05. | බලපිටිය වතුගෙදර ප්‍රධාන මාර්ගයේ වාඳදූව සිරි පවරන්දාරාම විහාරස්ථානය අසලින් ආරම්භ වී මහ කරාව මාර්ගයට සම්බන්ධ වන මාර්ගය | පූජ්‍ය වැලිතර සුධම්ම නාහිමි මාවත |

02-16

---

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතින් සංශෝධිත 1946 අංක 57 දරන ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 වන වගන්තියේ අංක I වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළයේ ඉද්දගොඩ පත්තුවේ 800ඩී දොඩන්ගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දොඩන්ගොඩ බටහිර ගමේ පිහිටියා වූ බෝධිසොටුවවත්ත හෙවත් පල්ලියවත්ත නැමති ඉඩමේ පහත උපලේඛනය පරිදි,

| | | |
|---|---|---|
| *උතුරට* | :- | කළුතර මතුගම ප්‍රධාන මාර්ගය |
| *දකුණට* | :- | බෝධිසොටුව කැලේ ලොට් 1ඒ ඉඩම |
| *නැගෙනහිරට* | :- | ප්‍රවේශ මාර්ගය සහ අංක 805ඒ ප්ලෑනේ ලොට් 1බී ද, |
| *බස්නාහිරට* | :- | ටී. පී. 52921 |

යන මායිම් තුළ පිහිටියා වූ ද, අක්කර - රූඩ් 2 පර්චස් 27.7 විශාල වූ ද,

දොඩන්ගොඩ අවසරලත් මිනින්දෝරු සී. බෙනරගම මහතා විසින් 2013.10.12 දින මැන සාදන ලද අංක 936 දරන පිඹුරු පතෙහි සඳහන් බෝධිසොටුවවත්ත හෙවත් පල්ලියවත්ත නැමති ඉඩම දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා සතු පොදු සුසාන භූමියක් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. කේ. ජගත් කීර්ති පෙරේරා,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 16 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-175

---

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වැනි වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ග වලට අයත් ඉඩම් වලින් අදාළ බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

චන්දන සිරිබද්දන,
සභාපති/ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව,
කඹුරුපිටිය.

*කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - මාර්ග ලියාපදිංචි කිරීම*

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *දෙපස ඇති ඉඩම් වම* | *දෙපස ඇති ඉඩම් දකුණ* | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| කනත්ත වත්ත | කරපුටුගල දකුණ | කනත්ත වත්ත කරපුටුගල දකුණ | දෙල්ගස්වත්ත කරපුටුගල දකුණ | සිරිධම්ම මාවත සිට කනත්ත වත්ත | කනත්තවත්ත කරපුටුගල දකුණ | කි. මී. 1/4 | අඩි 10 |

02-211

---

**මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) ඡේදය අනුව මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශ සීමාව තුළ පිහිටා ඇති පහත සඳහන් වගුවේ සඳහන් කර ඇති ග්‍රාම සංවර්ධන ග්‍රාමීයන් වශයෙන් ප්‍රකාශ කිරීම සඳහා 2006.11.17 දිනැති ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අවලංගු කර ඒ වෙනුවට දිසා පළාත් සභා සහකාර කොමසාරිස් විසින් නැවත ප්‍රසිද්ධ කරන බව මෙයින් දන්වමි.

| *ග්‍රාම* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *ග්‍රා. නි. කො. අංක* |
|---|---|---|
| පෙරිය කල්ලාරු | පෙරිය කල්ලාරු දකුණ 3 | 75 C |
| | පෙරිය කල්ලාරු 3 | 75A |
| | පෙරිය කල්ලාරු බස්නාහිර 2 | 75 B |
| | පෙරිය කල්ලාරු 2 | 75 |
| | පෙරිය කල්ලාරු දකුණ 1 | 76 A |
| | පෙරය කල්ලාරු | 76 |
| කෝට්ටයි කල්ලාරු | කෝට්ටයි කල්ලාරු දකුණ | 113 A |
| | කෝට්ටයි කල්ලාරු නැගෙනහිර | 113 B |
| | කෝට්ටයි කල්ලාරු බස්නාහිර | 113 C |
| | කෝටටයි කල්ලාරු උතුර | 113 |
| පට්ටිරුප්පුව | පට්ටිරුප්පුව | 116 C |
| කලුවාංචිකුඩිය | කලුවාංචිකුඩිය දකුණ | 116 A |
| | කලවාංචිකුඩිය උතුර | 116 |
| | කලුවාංචිකුඩිය උතුර 1 | 116 B |
| කලුදාවලේ | කලුදාවලේ 4 (ශාන්තිපුරම්) | 117 B |
| | කලුදාවලේ 4 | 117A |
| | කලුදාවලේ 3 | 117 |
| | කලුදාවලේ 2 | 119A |
| | කලුදාවලේ මධ්‍ය | 119 B |
| | කලුදාවලේ 1 | 119 |
| කුරුක්කල්මඩම් | කුරුක්කල්මඩම් දකුණ | 126 |
| | කුරුක්කල්මඩම් උතුර | 126 C |

02-201

# විවිධ දැන්වීම්

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන 149, 150, 152(i), (ii), 153 (i), 154 (i) වගන්ති ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014.01.01 වැනි දින සිට 2014.12.31 වැනි දින දක්වා පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර බදු කුච්චවේලි ප්‍රාදේශීය සභාව විසින් පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.

කුච්චවේලි ප්‍රාදේශීය සභාව,
නිලාවේලි.

උපලේඛනය

| | *ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 500 දක්වා* | *රු. 500 සිට රු.1,000 දක්වා* | *රු. 1,500 වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | තේ කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 2. | හෝටලයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 3. | තේ කඩයක් හෝ හෝටලයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 4. | ස්ථිර නිවසක් සමග නේවාසිකාගාරයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 5. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 6. | බේකරියක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 7. | ගිමන්හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 8. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 9. | බීඩි සුරුට්ටු එතීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 150 0 | 200 0 | 300 0 |
| 10. | මස් කඩයක් පවත්වාගෙන යාම | 700 0 | 800 0 | 900 0 |
| 11. | එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 12. | ගවමස් හෝ එළුමස් නොවන වෙනත් මස් වර්ග කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 13. | මාළු, මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 14. | ගිමන් හලක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 15. | චිත්‍රපට ශාලාවක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 16. | බොරළු හෝ කළුගල් කඩන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 700 0 | 800 0 | 900 0 |
| 17. | ගඩොල් උළු රැස්කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 18. | මැටි මගින් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 19. | සිමෙන්ති මගින් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 20. | ගොඩනැගිලි භාණ්ඩ රැස්කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 21. | යකඩ භාණ්ඩ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හාඩ්වෙයාර් | 800 0 | 900 0 | 1,000 0 |
| 22. | පරණ යකඩ බඩු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 23. | සිමෙන්ති පැකට් 25 කට වඩා වැඩියෙන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 24. | ලී මෝලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 25. | තල් ලී මෝලක් පවත්වාගනෙ යාම | 300 0 | 400 0 | 500 0 |
| 26. | දර ගබඩාවක් හෝ දර කඩයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 27. | වඩු කම්හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 28. | ගෘහ භාණ්ඩ සැකසීම හෝ පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 29. | යන්ත්‍ර භාවිතයෙන් ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 30. | යන්ත්‍ර භාවිතයෙන් ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 31. | යන්ත්‍ර භාවිතයෙන් යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 32. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 150 0 | 200 0 | 300 0 |
| 33. | සරුවත් පැණි බීම සකස් කර නිපදවීම | 250 0 | 300 0 | 400 0 |
| 34. | ඇසුරුම් පෙට්ටියකට වඩා සරුවත් පැණි බීම සකස්කර නිපදවීම | 300 0 | 400 0 | 500 0 |
| 35. | අයිස් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 36. | අයිස් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 37. | අයිස්ක්‍රීම් හා සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 38. | සිසිල් බීම ස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |

| *ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 500 දක්වා* | *රු. 500 සිට රු.1,000 දක්වා* | *රු. 1,500 වැඩි* |
| 39. සීනි බෝල නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 40. රස කැවිලි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 41. බීම වර්ග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 42. පළතුරු විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 43. එළවලු විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 44. එළදෙනුන් පට්ටියක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 45. කිරි රැස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 400 0 |
| 46. කොප්පරා නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 47. ගැලුම් 50කට වඩා වැඩියෙන් පොල්තෙල් රැස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 600 0 |
| 48. ගිනිකූරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 49. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා විකිණීම | 300 0 | 400 0 | 500 0 |
| 50. ආභරණ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 51. ආභරණ රන් වතුරේ දමන ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 52. තොග වෙළෙඳාම සඳහා හොණ්ඩර 10කට වඩා සහල් පිටි ඈණු වැනි දෑ පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 53. හොණ්ඩර 3කට වඩා තේ කොළ ව්‍යාපාරයක් | 100 0 | 200 0 | 300 0 |
| 54. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 |
| 55. සහල් විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 56. පපඩම් නිෂ්පාදනය හා විකිණීම | 100 0 | 200 0 | 300 0 |
| 57. තල්හකුරු නිෂ්පාදනය හා විකිණීම | 100 0 | 200 0 | 300 0 |
| 58. කඩල නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 59. ශීත කරන ලද මස් හෝ මාළු විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 60. වියළි මාළු හෝ කරවල රැස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 61. ආහාර වර්ග හෝ පළතුරු ටින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 62. දේශීය/විදේශීය මත් පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 63. සත්ත්ව ආහාර ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 64. කුකුලන් සඳහා ආහාර නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 65. කුකුල්ලු හා සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 66. පොල්/තල් රා රැස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 67. පිදුරු කඩයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 68. හිස් බෝතල් රැස් කරන ස්ථානයක් පැවැත්වීම | 300 0 | 400 0 | 500 0 |
| 69. නව/පැරණි පුවත්පත් රැස්කරන/විකුණුම් ස්ථානයක් පවත්වාගෙනයාම | 100 0 | 200 0 | 300 0 |
| 70. ටයර් 25කට වඩා වැඩියෙන් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 71. පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 72. යතුරුපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 73. රථවාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 74. රථ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 75. වෑල්ඩින් ගරාජයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 76. ටකරම් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 77. යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් ටකරම් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 78. ස්ප්‍රේ තීන්ත ආලේපය, ලේත් කිරීම ආදී ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 79. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 80. මෙට්ට නිෂ්පාදනය | 200 0 | 300 0 | 400 0 |
| 81. රථ වාහනවලට අමතර කොටස් සවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 82. ටයර්-ටියුබ් පැච් දමන ස්ථානයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 83. ටයර්-ටියුබ් අලුත්වැඩියා කිරීම | 500 0 | 600 0 | 700 0 |
| 84. රථ වාහන සඳහා ටයර්-ටියුබ් විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 85. ටයර් ටියුබ් නිෂ්පාදනය | 200 0 | 300 0 | 400 0 |
| 86. රථවාහන සඳහා අමතර කොටස් විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 87. යතුරු පැදි සඳහා අමතර කොටස් විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 88. ශීතකරණ නිෂ්පාදනය, අළුත්වැඩියාව හා රැස්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |

| | *ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 500 දක්වා* | *රු. 500 සිට රු.1,000 දක්වා* | *රු. 1,500 වැඩි* |
| 89. | ශීතකරණ හා අධි ශීතකරණ (ඩී ෆ්‍රීසර්) තිබීම | 200 0 | 300 0 | 400 0 |
| 90. | ගුවන්විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියාව | 500 0 | 600 0 | 700 0 |
| 91. | විදුලි උපකරණ හා විදුලි පංකා මෝටර් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 92. | මුද්‍රණාලයක් හා රෝනියෝ මැෂින් අලුත්වැඩියාව | 200 0 | 400 0 | 700 0 |
| 93. | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී සඳහා අමතර කොටස් විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 94. | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී හා මහන මැෂින් විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 95. | විදුලි උපකරණ විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 96. | විදුලි උපකරණ නිෂ්පාදනය | 200 0 | 300 0 | 400 0 |
| 97. | ජල පොම්ප නිෂ්පාදනය | 200 0 | 300 0 | 400 0 |
| 98. | ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පැවැත්වීම | 300 0 | 400 0 | 500 0 |
| 99. | නව යතුරු පැදි විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 400 0 | 500 0 | 600 0 |
| 100. | පෙට්‍රෝල්, ඩීසල් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 101. | පෙට්‍රෝල්, ඩීසල් විකිණුම් ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 102. | පුවත්පත් විකිණීමේ හා බෙදාහැරීමේ ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 103. | අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන යතුරුලියන යන්ත්‍රයක් තිබීම | 300 0 | 400 0 | 500 0 |
| 104. | විදුලි බලයෙන් ක්‍රියා කරන යතුරුලියන යන්ත්‍රයක් තිබීම | 300 0 | 400 0 | 500 0 |
| 105. | පොදු දැන්වීම් සේවා ස්ථානයක් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 106. | සංචාරක ව්‍යාපාර පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 107. | විදේශ රැකියා ආයතනයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 108. | දේශීය වෛද්‍ය විශේෂඥ සේවාවක් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 109. | පෞද්ගලික පශු වෛද්‍ය ස්ථානයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 110. | පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 111. | බටහිර වෛද්‍ය විශේෂඥ සේවාවක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 112. | පෞද්ගලික ඉංග්‍රීසි බෙහෙත් (ෆාමසි) ස්ථානයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 113. | ආයුර්වේද බෙහෙත් ඖෂධ විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 114. | දන්ත ශල්‍යාගාරයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 115. | ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 116. | ආයුර්වේද බෙහෙත් ඖෂධ නිෂ්පාදනය | 700 0 | 800 0 | 900 0 |
| 117. | පේෂකර්ම ස්ථානයක් පැවැත්වීම (අත්යන්ත්‍ර මගින්) | | | |
| 118. | රෙදි විවීම හා නූල් කැටීම | 100 0 | 200 0 | 300 0 |
| 119. | පේෂකර්ම ස්ථානයක් පැවැත්වීම (බලවේග මගින්) (රෙදි විවීම හා නූල් එතීම) | 100 0 | 200 0 | 300 0 |
| 120. | ඇඟලුම් කම්හලක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 121. | ෂර්ට් කම්හලක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 122. | ඇඳුම් බතික් කරන ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 123. | ඇඳුම් මහන ස්ථානයක් පැවැත්වීම | 600 0 | 700 0 | 800 0 |
| 124. | ඇඳුම් බතික් කරන ස්ථානයක් පැවැත්වීම | 400 0 | 500 0 | 600 0 |
| 125. | මසා නිමකළ විකුණුම්/නිෂ්පාදනය | 800 0 | 900 0 | 1,000 0 |
| 126. | රසායනික පොහොර නිෂ්පාදනය | 800 0 | 900 0 | 1,000 0 |
| 127. | සම් භාණ්ඩ හෝ පාවහන් නිපදවීම | 200 0 | 300 0 | 400 0 |
| 128. | පාවහන් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 400 0 | 500 0 | 600 0 |
| 129. | ආඩම්බරාත්මක භාණ්ඩ නිපදවීම/විකිණීම | 600 0 | 700 0 | 800 0 |
| 130. | සුවඳ විලවුන් නිපදවන ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 131. | සබන් නිපදවන ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 132. | ප්ලාස්ටික් භාණ්ඩ විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 133. | ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 600 0 | 700 0 |
| 134. | පීවීසී බට නිෂ්පාදනය/විකිණීම | 100 0 | 200 0 | 300 0 |
| 135. | හුණු/හුණු ගල් ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 136. | ගැලුම් 5කට වඩා තීන්ත වාර්නිෂ් භාණ්ඩ තිබීම | 200 0 | 300 0 | 400 0 |
| 137. | තීන්ත වාර්නිෂ් භාණ්ඩ තිබීම | 500 0 | 600 0 | 700 0 |
| 138. | කුකුල් පට්ටි තිබීම (500කට වඩා වැඩි) | 800 0 | 900 0 | 1,000 0 |
| 139. | වී ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 140. | මිරිස්, පිටි ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 141. | අත්යන්ත්‍ර භාවිතයෙන් පොල් තෙල් හිඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 142. | යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් හිඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 143. | පතොරම්, රතිඤ්ඤා නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 144. | කණ්ණාඩි හෝ මැටි භාණ්ඩ නිෂ්පාදනය/විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 145. | කණ්ණාඩි නිෂ්පාදන ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |

| | *ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 500 දක්වා* | *රු. 500 සිට රු.1,000 දක්වා* | *රු. 1,500 වැඩි* |
| 146. | පින්තූර රාමු කරන ස්ථානයක් පැවැත්වීම | 400 0 | 500 0 | 600 0 |
| 147. | සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය/විකිණීම | 200 0 | 300 0 | 400 0 |
| 148. | ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය/විකිණීම | 400 0 | 500 0 | 600 0 |
| 149. | සාමාන්‍ය අන්දමින් ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය/විකිණීම | 400 0 | 300 0 | 500 0 |
| 150. | කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය | 500 0 | 600 0 | 700 0 |
| 151. | බාල්දි නිෂ්පාදනය | 200 0 | 300 0 | 400 0 |
| 152. | ඡායාරූප ගන්නා ස්ටුඩියෝවක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 153. | ගුවන්විදුලි කැසට් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 200 0 | 300 0 | 1,000 0 |
| 154. | වීඩියෝ කැසට් විකිණීම/කුලියට දීම | 600 0 | 700 0 | 800 0 |
| 155. | ඡායා පිටපත් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 600 0 | 700 0 | 800 0 |
| 156. | මංගල භාණ්ඩ විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 700 0 | 800 0 | 900 0 |
| 157. | අවමංගල්‍ය භාණ්ඩ විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 158. | කට්පුරම් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 100 0 | 200 0 | 300 0 |
| 159. | පිත්තල, ලෝකඩ විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 160. | පාසල් උපකරණ විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 600 0 | 700 0 | 800 0 |
| 161. | පරිගණක විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 162. | දුම්මල බාම් පැවැත්වීම | 200 0 | 300 0 | 400 0 |
| 163. | සාමාන්‍ය ධීවර ඔරු තිබීම | 300 0 | 400 0 | 500 0 |
| 164. | කුඩා ධීවර කර්මාන්තය සඳහා ඔරු තිබීම | 300 0 | 400 0 | 500 0 |
| 165. | ගල් කැඩීම (අතින්) | 500 0 | 750 0 | 1,000 0 |
| 166. | ගල් කැඩීම (යාන්ත්‍රිකව) | 300 0 | 400 0 | 500 0 |
| 167. | පරෙවි දූපතට සංචාරකයින් ගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 168. | යාන්ත්‍රික බෝට්ටු තිබීම | 500 0 | 600 0 | 700 0 |
| 169. | තාවකාලිකව ධීවර කර්මාන්තයේ යෙදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 170. | ගොඩනැගිලි සැලසුම් ලබාදෙන ස්ථාන පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 171. | රෙස්ටුරන්ට් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 172. | ඉස්සෝ වාඩි පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 173. | පරිගණක ස්ථාන පැවැත්වීම | 750 0 | 800 0 | 900 0 |
| 174. | ත්‍රීවීල් නවාතැන් පොළවල් පැවැත්වීම | දිනකට 1,000 0 | | |
| 175. | සම්මන්ත්‍රණ ශාලා කුලියට දීම | 600 0 | 700 0 | 800 0 |
| 176. | දුරකථන මධ්‍යස්ථාන පැවැත්වීම | 300 0 | 600 0 | 700 0 |
| 177. | කුඩා පෙට්ටි ව්‍යාපාර ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 178. | සිමෙන්ති ගල් විකුණුම් ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 179. | ගල් කඩන ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 180. | වාහන සර්විස් කරන ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 181. | මීහරක් පට්ටි සිටීම | 800 0 | 900 0 | 1,000 0 |
| 182. | බීම වර්ග තොග වෙළඳාම | 500 0 | 600 0 | 700 0 |
| 183. | මුරුක්කු හා කඩල ව්‍යාපාරය | 800 0 | 900 0 | 1,000 0 |
| 184. | ධීවර කර්මාන්ත සඳහා ටැංකි පිරවීම (ඔක්සිජන්) | 800 0 | 900 0 | 1,000 0 |
| 185. | මාලු වාඩි පැවැත්වීම | | දිනකට 50 0 | |
| 186. | වාණිජ පදනම මත ඇතුළු වන වාහන ගාස්තු | 400 0 | 500 0 | 600 0 |
| 187. | ඉස්සෝ වාඩි පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 188. | අයිස් වාඩි පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 189. | මාලු ඇල්ලීම සඳහා බෝට්ටු තිබීම | 500 0 | 600 0 | 700 0 |
| 190. | ධීවර බෝට්ටු අලවන යන්ත්‍ර තිබීම පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 191. | ඔරු තිබීම | 200 0 | 300 0 | 600 0 |
| 192. | ප්ලාස්ටික් බෝට්ටු තිබීම | 300 0 | 400 0 | 500 0 |
| 193. | කරවල සඳහා මාලු තිබීම | 200 0 | 300 0 | 400 0 |
| 194. | ඉස්සෝ ඇල්ලීමට හා නතර වීමට වාඩි තිබීම | 500 0 | 600 0 | 700 0 |
| 195. | පා ගමනින් ගොස් මුරුක්කු ව්‍යාපාරයේ යෙදීම | 300 0 | 400 0 | 500 0 |
| 196. | ධීවර කර්මාන්තය සඳහා උපකරණ විකිණීම | 900 0 | 950 0 | 1,000 0 |
| 197. | පාගමනින් ව්‍යාපාරයේ යෙදීම | 200 0 | 300 0 | 400 0 |
| 198. | අන්තර් ජාල සම්බන්ධතා පැවැත්වීම (ෆැක්ස්) | 900 0 | 950 0 | 1,000 0 |
| 199. | පරිගණක පුහුණු මධ්‍යස්ථාන පැවැත්වීම | 900 0 | 950 0 | 1,000 0 |
| 200. | ත්‍රීවීල් නතර කරන ස්ථාන පැවැත්වීම | 900 0 | 950 0 | 1,000 0 |

| *ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 500 දක්වා* | *රු. 500 සිට රු.1,000 දක්වා* | *රු. 1,500 වැඩි* |
| 201. 20ට අඩු එළ හරක් සිටීම | 900 0 | 950 0 | 1,000 0 |
| 202. 35ට වැඩියෙන් එළ හරක් සිටීම | 900 0 | 950 0 | 1,000 0 |
| 203. 15ට වඩා අඩු මීහරක් සිටීම | 300 0 | 400 0 | 500 0 |
| 204. 15ට වඩා වැඩියෙන් මී හරක් සිටීම | 600 0 | 700 0 | 800 0 |
| 205. 30ට වැඩියෙන් මී හරක් සිටීම | 900 0 | 950 0 | 1,000 0 |
| 206. ගඩොල් රැස්කිරීම/කැපීම | 600 0 | 700 0 | 800 0 |
| 207. උළු/ග්‍රිල් ආදිය විකිණීම | 900 0 | 950 0 | 1,000 0 |
| 208. සන්නිවේදන උපකරණ විකිණීම | 700 0 | 800 0 | 900 0 |
| 209. 20ට වැඩි හා 35ට අඩු එළ හරක් සිටීම | 600 0 | 700 0 | 800 0 |
| 210. සුවඳ විලවුන් පැකට් කරන ස්ථාන පැවැත්වීම | 700 0 | 800 0 | 900 0 |
| 211. ඇඳුම් විකුණුම් ස්ථානයක් තිබීම | 700 0 | 800 0 | 900 0 |
| 212. කේබල් සම්බන්ධතා කණුවක් තිබීම (වසරකට) | 200 0 | 300 0 | 400 0 |
| 213. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 214. ඉන්ධන වායු විකිණීම (ගෑස්) | 700 0 | 800 0 | 900 0 |
| 215. පෞද්ගලික අධ්‍යාපන ආයතන පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 216. ජංගම දුරකථන විකුණුම් ස්ථානයක් තිබීම | 800 0 | 900 0 | 1,000 0 |
| 217. ප්ලාස්ටික් බෝතල්, තෙල් වර්ග විකිණීම | 800 0 | 900 0 | 1,000 0 |
| 218. සන්නිවේදන (ඉන්ටනෙට්) ස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |
| 219. පිටි මගින් පිළියෙල කරන ආහාර විකිණීම | 800 0 | 900 0 | 1,000 0 |
| 220. සිප්පි කටු හා බෙල්ලන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 221. රියදුරු පුහුණු මධ්‍යස්ථානයක් පැවැත්වීම | 800 0 | 900 0 | 1,000 0 |

02-21/1

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

ව්‍යාපාර බදු අයකිරීම - 2014

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තියට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර ව්‍යාපාර ස්ථානයක් පවත්වා වෙළෙඳාමේ යෙදෙන ව්‍යාපාරිකයන් සඳහා බදු අයකිරීම, ව්‍යාපාරයේ ස්වභාවය මත ව්‍යාපාරිකයාගේ පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලැබීම් පරිදි පහත උපලේඛන අංක I හා II අනුව වාර්ෂික බද්දක් 2014 වර්ෂය සඳහා ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

කුච්චවේලි ප්‍රාදේශීය සභාව,
නිලාවෙලි.

### උපලේඛනය I

| *වාර්ෂික ආදායම* | *ගෙවිය යුතු බද්ද රු. ශ.* |
|---|---|
| 1. රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක | කිසිවක් නොමැත |
| 2. රු. 6,000 ඉක්මවන එහෙත් 12,000 නොඉක්මවූ විට | 90 0 |
| 3. රු. 12,000 ඉක්මවන එහෙත් 18,750 නොඉක්මවූ විට | 180 0 |
| 4. රු. 18,750 ඉක්මවන එහෙත් 75,000 නොඉක්ම වූ විට | 360 0 |
| 5. රු. 75,000 ඉක්මවන එහෙත් 1,50,000 නොඉක්මවූ විට | 1,200 0 |
| 6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

### උපලේඛනය II

*ව්‍යාපාරයේ ස්වභාවයට අනුව බදු අය කළ යුතු කර්මාන්ත :*

1. සුරුට්ටු, බීඩි එතීමේ ව්‍යාපාර පැවැත්වීම
2. ගඩොල්, උළු නිෂ්පාදන ව්‍යාපාර පැවැත්වීම
3. අයිස් නිෂ්පාදන ව්‍යාපාර පැවැත්වීම
4. වෙන්දේසිකරුවකු හා දැන්වීම්කරුවකු ලෙස ක්‍රියා කිරීම
5. තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීම
6. භාණ්ඩ උකසට ගන්නකු ලෙස ක්‍රියාකිරීම
7. පෞද්ගලික අධ්‍යාපන පංති පැවැත්වීම
8. විගණකාධිපතිවරයෙක් සේ ක්‍රියා කිරීම
9. පෞද්ගලික ආරෝග්‍යශාලා පැවැත්වීම
10. වාණිජ බැංකු පවත්වාගෙන යාම
11. ආපන ශාලාවක් පවත්වාගෙන යාම

02-21/2

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### ඉල්ලුම්පත්‍ර ගාස්තු හා සහතික පත්‍ර ගාස්තු සඳහා බදු අයකිරීම - 2014 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉල්ලුම්පත්‍ර හා සහතික පත්‍ර සඳහා අනුමැතිය ලබාදීම සඳහා 2014.01.01 දින සිට පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ආකාරයට ගාස්තු අයකරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | *රු. ශ.* |
|---|---|---|
| 1. | ඉඩම් පැවරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තු | 200 0 |
| 2. | පරිසර බලපත්‍ර ගාස්තුව | 300 0 |
| 3. | වැසිකිළි ඉදිකිරීමේ ඉල්ලුම් පත්‍රය සඳහා | 100 0 |
| 4. | පරීක්ෂණ ගාස්තු | 450 0 |
| 5. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 6. | දේපළ පවරා නොගැනීම සඳහා බලපත්‍ර ගාස්තු (නන් වෙස්ටරින්) | 250 0 |
| 7. | වීථි රේඛා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු | 250 0 |
| 8. | නිලධාරිවරුන්ගේ තැන්පතුව සඳහා | 100 0 |

02-21/3

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2014 වර්ෂය

කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිටින හෝ ඇතිකරන සුනඛයින් සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 477 දරන 4 වැනි වගන්තිය ප්‍රකාරව වර්ෂ 2004 සිට සුනඛයකු සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. පහක් (5) පනවා අය කරන බව නිවේදනය කරන අතර, තව ද 2014 වර්ෂය සඳහා මෙම ගාස්තු මාර්තු 31 වැනි දිනට පෙර ගෙවා නිම කළ යුතුයි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-21/4

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### ගාල් නොකරන ලද සතුන් තහනම් කිරීම - 2014

1987 අංක 661 දරන ප්‍රාදේශීය සභා පනතේ (1), (3), (4) යන වගන්තියට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ගයේ හෝ අතුරු මාර්ගවල හෝ පොදු ස්ථානවල නොබැඳ ගැවසෙන එළුවන්, ගවයින් ආදී සතුන්ව ප්‍රාදේශීය සභාව විසින් අල්ලා, ඒ සඳහාම ඉදිකර ඇති පොදු ස්ථානයේ ආරක්ෂිතව බැඳ තබන අතර, ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි වර්ෂ 2014.01.01 වැනි දින සිට ගාස්තු පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | *රු. ශ.* |
|---|---|---|
| 1. | ගාල් නොකරන සතෙකු ඇල්ලීම සඳහා | 500 0 |
| 2. | ආරක්ෂිතව තැබීම සඳහා (දිනකට) | 100 0 |
| 3. | ආහාර සඳහා (දිනකට) | 250 0 |
| 4. | එක් දිනක් තුළදී නැවත ගවයාව ලබා නොගන්නා අවස්ථා අතිරේක සෑම දිනක් සඳහාම | 250 0 |

තව ද මෙලෙසින් අල්ලන ගවයින් සඳහා ගව හිමියා විසින් ඒ සඳහා නියමිත දඩ මුදල දින හතක් ඇතුළත ගෙවා මුදා නොගතහොත්, එම සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ දමන අතර, එයින් ලැබෙන මුදල් ප්‍රාදේශීය සභා ගිණුමට බැර කරන බව ද මෙයින් නිවේදනය කරමි.

02-21/5

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2014 වර්ෂය

1952 වර්ෂයේ අංක 6 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තියට ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 යන වගන්තියේ (iv) (ආ) හි පැවරී ඇති බලතල ප්‍රකාරව මෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් වර්ෂ 1999.01.04 වැනි දින පළ කළ *ගැසට් පත්‍රයේ* අතුරු ව්‍යවස්ථාවට අනුව අංක 39 වැනි වගන්තියට ප්‍රකාරව දැන්වීම් ගාස්තු පහත උපලේඛනයට අනුව වර්ෂ 2014.01.01 දින සිට ගාස්තු අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

#### උපලේඛනය

| | *විස්තරය* | *ප්‍රමාණය* | *කාල සීමාව* | |
|---|---|---|---|---|
| | | | *මාස 3ක් සඳහා රු. ශත* | *මාස 12 ක් සඳහා රු. ශත* |
| 1. | ප්‍රචාරක දැන්වීම් බැනර් සඳහා | වර්ග අඩි එකකට | 10 0 | 40 0 |
| 2. | තාවකාලික දැන්වීම් සඳහා | වර්ග අඩි එකකට | 25 0 | 100 0 |
| 3. | ස්ථිර දැන්වීම් සඳහා | වර්ග අඩි එකකට | 15 0 | 50 0 |
| 4. | පුවරු දැන්වීම් සඳහා | වර්ග අඩි එකකට | 25 0 | 50 0 |

02-21/6

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### මාර්ග ප්‍රවාහන ගාස්තු සඳහා බදු අයකිරීම - 2014 වර්ෂය

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පවරා ඇති බලතල වලට අනුව වර්ෂ 2013.12.17 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව තීරණ අංක 32 යටතේ සභා සම්මත වූ බව දන්වා සිටින අතර, එම යෝජනාව පහත දැක්වේ.

**සභා සම්මත යෝජනාව**

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පවරා ඇති බලතල වලට අනුව 2014 වර්ෂය සඳහා පහත උපලේඛනයට අනුව මාර්ග ප්‍රවාහන ගාස්තු අයකරන බව යෝජනා කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

*උපලේඛනය*

| | | *රු. ශ.* |
|---|---|---|
| 1. | බොරළු කියුබ් එකක් සඳහා | 50 0 |
| 2. | වැලි කියුබ් එකක් සඳහා | 50 0 |
| 3. | කළුගල් කියුබ් එකක් සඳහා | 50 0 |

02-21/7

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### ස්ථිර ව්‍යාපාර ස්ථානයක් නොමැතිව සැරිසරා වෙළෙඳාමේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා බදු අයකිරීම - 2014

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පවරා ඇති බලතල වලට අනුව 2012.05.30 වැනි දින අංක 520/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පිටු අංකIV (ආ) හි ප්‍රාදේශීය පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළකල අතුරු ව්‍යවස්ථාවේ අංක 28 දරන පනත ප්‍රකාරව කුච්චවේලි ප්‍රදේශයේ පාලන බල ප්‍රදේශය තුළ ස්ථිර ව්‍යාපාර ස්ථානයක් නොමැතිව සැරිසරා වෙළෙඳාමේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා වර්ෂ 2013.12.17 වන දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 32 යටතේ පහත උපලේඛනයට අනුව වර්ෂ 2014.01.01 දින සිට බදු අයකළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

*උපලේඛනය*

| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *බදු රු. ශ.* |
|---|---|---|
| 1. | ලොරි මගින් ව්‍යාපාරයේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා (දිනකට) බිත්තර, පොල්, අයිස්ක්‍රීම් | 50 0 |
| 2. | අත් කරත්ත, තල්ලු කරන කරත්ත ආදිය මගින් සෞඛ්‍යයට හිතකර ආහාර පාන විකිණීම සඳහා (වසරකට) | 150 0 |
| 3. | රථවාහන භාවිතය මගින් කිරි වෙළෙඳාම සඳහා (වසරකට) | 500 0 |

02-21/8

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### වාහන හා සතුන් සඳහා බදු අයකිරීම - 2014

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(3) වගන්තිය ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයට අනුව වර්ෂ 2014.01.01 වැනි දින සිට වාහන හා සතුන් සඳහා බදු අය කරන අතර, මෙම ගාස්තු සෑම වසරකම මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර අදාළ උප කාර්යාලයට ගෙවිය යුතු බවද මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | මෝටර් රථවාහන, ත්‍රිවීල්, ලොරි, පාපැදි යතුරු පැදි, රික්ෂෝ හැර අනෙකුත් වාහන සඳහා | 25 0 |
| 2. | සෑම පාපැදියක් හා ත්‍රිවීලරයක් සඳහා | |
| | *(අ)* වාණිජ ව්‍යාපාරයක් සඳහා | 15 0 |
| | *(ආ)* වාණිජමය නොවන වෙනත් ව්‍යාපාර සඳහා | 4 0 |
| 3. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| 5. | සෑම රික්ෂෝ ජෝඩුවක් සඳහා | 7 0 |
| 6. | සෑම අශ්වයකු සඳහා | 15 0 |
| 7. | සෑම අලියකු සඳහා | 50 0 |

මේ සමග අයදුම්පත් ගාස්තු මෝටර් රථ සඳහා රු. 16.0 ක මුදලක් හා වෙනත් දේ සඳහා රුපියල් 20.0 මුදලක් අයකරන බව තවදුරටත් දන්වා සිටිමි.

02-21/9

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවෙලි

### රථ වාහන ගාල් කිරීම සඳහා බලපත්‍ර ගාස්තු - 2014 වර්ෂය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් වර්ෂ 1998.02.13 වැනි දින පළ කළ *ගැසට් පත්‍රයේ* පිටු අංක (iv) වැනි වගන්තිය රථ වාහන ගාල් කිරීමේ අතුරු ව්‍යවස්ථාවට ප්‍රකාරව පහත උපලේඛනයට අනුව පහත දැක්වෙන ස්ථාන "ත්‍රීවීල් රථ ගාල් කරන ස්ථාන" බවත් මෙහි නතර කරන ත්‍රීවීල් සඳහා වසරකට බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 750 ක් පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1. පෙරියකුලම් හන්දිය
2. කොන්සපුරි හන්දිය
3. ඉක්බාල් නගර් පල්ලිය අසල
4. නිලාවෙලි අටේ (08) කණුව හන්දිය
5. නිලාවෙලි ග්‍රාමීය රෝහලට ඉදිරියෙන්
6. ගෝපාලපුර පාසල පාර හන්දිය
7. ඉරක්කන්ඩි ධීවර හන්දිය

8. කුඹුරුපිටි හන්දිය පේකා හන්දිය.
9. කුඹුරුපිටි හන්දිය.
10. කුච්චවෙලි රෝහලට ඉදිරියෙන්.
11. කාසිම් නගර් පල්ලියට ඉදිරියෙන්.
12. ජායා නගර් පල්ලියට ඉදිරියෙන්.
13. පුල්මුඩේ ත්‍රිකුණාමල හන්දිය.
14. පුල්මුඩේ රෝහලට ඉදිරියෙන්.
15. පුල්මුඩේ 04 වැනි කොට්ඨාසයේ තාරුසලාම් පල්ලිය අසල.
16. බණිජ වැලි සංස්ථාවට ඉදිරියෙන්.
17. නිලාවේලි බීච් හොටෙල් හංදිය ඉදිරිය.
18. කෝකිලායි මුවදොර අසල.
19. පුඩවකට්ටු පාලම අසල.
20. නිලාවේලි නව වෙළඳපොලට ඉදිරියේ

02-21/10

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

### දේපළ මත බදු අය කිරීම - 2014

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන 134 යන වගන්තියෙන් ප්‍රකාරව පැවරී ඇති බලතල වලට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සියලුම දේපළ සඳහා පහත උපලේඛනයට අනුව වර්ෂ 2014 සඳහා මීට පෙර වසර තුළ පැවති ප්‍රතිශතයට අනුව දේපළ බදු පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| 1. | නිලාවෙලි උපකාර්යාලයට අයත් කුඹුරුපිටිය හැර අනෙකුත් ප්‍රදේශ සඳහා | 4% |
| 2. | නිලාවෙලි උපකාර්යාලයට අයත් කුඹුරුපිටිය ප්‍රදේශයේ වාණිජ ව්‍යාපාර සඳහා | 6% |
| 3. | පුල්මුඩේ උපකාර්යාලයට අයත් ප්‍රදේශ සඳහා | 6% |

තව ද මෙම දේපළ බදු අනුපිළිවෙලට මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර හෝ කාර්තු 04ක දී සමාන අයුරින් ගෙවිය යුතු ය.

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන 134-7 යන වගන්තියන් ප්‍රකාරව පහත දැක්වෙන පරිදි වට්ටම් ද දෙනු ලැබේ.

*(අ)* 2014.01.31 වැනි දින හෝ ඊට පෙර වාර්ෂික බදු සම්පූර්ණ වශයෙන් ගෙවන්නේ නම් 10%ක ප්‍රතිශතයක වට්ටම් ප්‍රදානය කරනු ලැබේ.

*(ආ)* වාර්ෂික බදු ඒ ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5%ක ප්‍රතිශතයක වට්ටම් ප්‍රදානය කරනු ලැබේ.

තව ද ඉහත සඳහන් කරන ලද දිනයන්ට පසුව ගෙවන ලද සියලුම බදු සඳහා ද හිස් ඉඩම් සඳහා මෙන්ම ස්ථිර පදිංචි වාසස්ථාන 15% ප්‍රතිශතයක් ද අනෙකුත් සෑම ඉඩම් සඳහා 20%ක ප්‍රතිශතයක් ද අධිගාස්තු වශයෙන් පනවා අය කරනු ලබන බව මෙයින් තවදුරටත් නිවේදනය කරමි.

02-21/11

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

### පාරිසරික ආරක්ෂණ බලපත්‍රය - 2014

වර්ෂ 1988 අංක 56 දරන හා 2000 වසරේ අංක 53 දරන සංශෝධිත පනත්වලින් හා වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ "23අ" වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබා දී ඇති උපදෙස් මත ස්වයං රැකියා සඳහා බලපත්‍ර ගාස්තු, පරීක්ෂණ ගාස්තු, ප්‍රවේශපත්‍ර ගාස්තු ආදිය සඳහා වර්ෂ 2000 නොවැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පළ කළ ගැසට් පත්‍රයේ පිටු අංක (i) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල මත 2013 වසරේ ද බදු පනවා අය කරන බව මෙයින් නිවේදනය කරන අතරම වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන 147 වගන්තිය ප්‍රකාරව අය කරනු ලබන වරිපනම් බදු සඳහා කිසිදු අයුරකින් බල නොපාන බව ද තව දුරටත් මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-21/12

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

### වාහන හා එහි අමතර කොටස් සඳහා බදු අයකිරීම - 2014

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා එහි අමතර කොටස් බද්දට දීම සඳහා වර්ෂ 2013.12.17 වන දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 32 යටතේ පහත උපලේඛනයට අනුව වර්ෂ 2014.01.01 දින සිට බදු අයකළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

නිලාවෙලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*අමතර සෑම පැයක් සඳහාම*
(පැය 08ක් සඳහා)

| | | *රු. ශ.* | *රු. ශ.* |
|---|---|---|---|
| 1. | ට්‍රැක්ටරය පෙට්ටියත් සමග | 4,025 0 | 504 0 |
| 2. | Bibrater | 2,600 0 | 325 0 |
| 3. | මික්සර් මැෂින් | 3,150 0 | 394 0 |
| 4. | ජල බවුසර ට්‍රැක්ටරය පෙට්ටියත් සමග | 4,200 0 | 525 0 |
| 5. | රෝලර් | 4,000 0 | 500 0 |
| 6. | ටිපර් | 5,000 0 | 625 0 |
| 7. | ජල බවුසර | 1,100 0 | 137 50 |
| 8. | ගලිබවුසර් ලෝඩ් එකක් සඳහා | 3.100 0 | - |

02-21/13

### කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

තොරතුරු සේවා අංශය මගින් සේවා පදනම මත ඡායාපිටපත් (ෆොටෝකොපි) ලබා ගැනීම සඳහා ගාස්තු අය කිරීම - 2014

2014.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු සේවා අංශය මගින් සේවා පදනම මත ඡායා පිටපත් (ෆොටෝ කොපි) ලබාගැනීම සඳහා වර්ෂ 2013.12.17 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 32 යටතේ පහත උපලේඛනයට අනුව වර්ෂ 2013.01.01 දින සිට ගාස්තු අය කළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.

නිලාවේලි, කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *කොළයේ ප්‍රමාණය* | *එක් පැත්තක් සඳහා රු ශත* | *පැති දෙකටම රු. ශත* |
|---|---|---|
| 1 A 4 | 3 0 | 4 0 |
| 2 A 5 | 7 0 | 8 0 |
| 3 B 4 | 4 0 | 6 0 |
| 4 B 5 | 2 0 | 3 0 |

02-21/14

### කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

වාර්ෂික ආදායමින් ආපන ශාලා සහ නේවාසිකාගාර සඳහා වරිපනම් බදු අයකිරීම - 2014

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන 149 වගන්තිය ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාර්ෂික ආදායමින් ආපන ශාලා සහ නේවාසිකාගාර සඳහා 01%ක වරිපනම් බදු පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.

නිලාවේලි,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-21/15

### කුච්චවේලි ප්‍රාදේශීය සභාව - නිලාවේලි

ගෝඝාතක ආඥාපනතට අනුව බලපත්‍ර ගාස්තු - 2014
(272 අධිකාරය) 7(2) යටතේ දැන්වීම

කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ටෙන්ඩර් ලබාගත් සෑම ටෙන්ඩර්කරුවෙකුට ම ගෝඝාතක ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) අංක 17 (i) වගන්තිය ප්‍රකාරව මාහට පැවරී ඇති බලතල මත හා පහත උපලේඛනයේ සඳහන් පරිදි හා රජය විසින් අනුමත දිනයන්හි මෙන්ම මා විසින් විටින් විට දැනුම් දෙනු ලබන දිනයන්හි ගව ඝාතනය, ගව මස් ව්‍යාපාර පිණිස එල්ලා තැබීම හා මස් කඩ විවෘත කර තැබීම සම්පූර්ණයෙන් ම තහනම් කළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති.

කුච්චවේලි ප්‍රාදේශීය සභාව,
නිලාවේලි.

**උපලේඛනය**

1. තෛපොන්ගල් දිනය (ජනවාරි 15)
2. මාට්ටු පොන්ගල් (තෛපොන්ගල් දිනයට පසු දින හෙවත් ජනවාරි 16)
3. ශ්‍රී ලංකා නිදහස් දිනය (පෙබරවාරි 04)
4. මහා සිවරාත්‍රී දිනය (පෙබරවාරි 16)
5. වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දින (මැයි මස 02)
6. ලෝක සත්ත්ව දිනය (ඔක්තෝබර් මස 04)
7. දීපාවලි අලුත් අවුරුද්ද
8. අනෙකුත් පෝය දිනයන් (මාසිකව)

02-21/16

### ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම - 2014

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149, වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු පහත දක්වා ඇති අංක 01 උපලේඛනයේ පරිදි ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයට බලපැවැත්වෙන පරිදි පනවා එය 2014 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම අය කිරීමට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ 2013.12.23 වැනි දින පැවති සභා රැස්වීමේ දී අංක 99 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. චන්දන විජිත කුමාර,
සභාපති,
ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 03 වන දින,
ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | තක්සේරු වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | රු. 1,500 සිට රු. 3,000 දක්වා රු. ශත | රු. 3,000 සිට ඉහලට රු. ශත |
|---|---|---|---|---|
| 01 | හෝටල් හෝ කෑමදෙන ස්ථාන | 1,000 0 | 1,200 0 | 1,500 0 |
| 02 | ග්‍රොසරියක් සඳහා | 750 0 | 1,000 0 | 1,250 0 |
| 03 | ලී ඉරුම්හලක් සඳහා | 750 0 | 1,000 0 | 1,250 0 |
| 04 | මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | කෘතිම පොහොර ගබඩාවක් සඳහා | 1,000 0 | 1,250 0 | 1,500 0 |
| 06 | ගෘහ ආශ්‍රිත මිරිස් කුඩු, තුනපහ හා බයිට් පැකට් කිරීමේ ස්ථාන | 300 0 | 450 0 | 600 0 |
| 07 | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථාන | 250 0 | 450 0 | 750 0 |
| 08 | ගුවන්විදුලි, රූපවාහිනී, පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථාන | 750 0 | 900 0 | 1,200 0 |
| 09 | ඇඳුම් මැසීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය | 750 0 | 1,000 0 | 1,500 0 |
| 11 | ගෑස් විකිණීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | වාහන අමතර කොටස් අලෙවි කරන ස්ථාන | 750 0 | 1,000 0 | 1,500 0 |
| 13 | ඉංග්‍රීසි බෙහෙත් සාප්පුවක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 14 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් | 750 0 | 1,000 0 | 1,500 0 |
| 15 | ගීත පටිගත කිරීම හා රූප පටිගත කිරීමේ ස්ථානයක් සඳහා | 400 0 | 500 0 | 750 0 |
| 16 | ඩීසල් හෝ ඉන්ධන නිධන්ගත කරන ස්ථාන සඳහා | 1,000 0 | 1,250 0 | 1,500 0 |
| 17 | මාළු විකුණන ස්ථාන සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 18 | යකඩ බඩු අලෙවිය සඳහා | 750 0 | 1,000 0 | 1,250 0 |
| 19 | වෑල්ඩින් වැඩපලක් සඳහා | 750 0 | 1,000 0 | 1,250 0 |
| 20 | සුරතල් සතුන් අලෙවිකරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 21 | වැලිගොඩ දැමීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 22 | වැලිකියුබ් 05ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කරන ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 23 | බොරළු ගබඩාකර අලෙවි කරන ස්ථානයක් සඳහා | 1,000 0 | 1,500 0 | 1,750 0 |
| 24 | පාපැදි හා අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 25 | ගවයින් 10ට වැඩි ගව පට්ටියක් සඳහා | 250 0 | 450 0 | 600 0 |
| 26 | සිල්ලර වෙළඳසැල් | 400 0 | 600 0 | 750 0 |
| 27 | තේ වෙළඳසැල් | 200 0 | 300 0 | 450 0 |
| 28 | සාප්පුබඩු වෙළඳසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 29 | රෙදිපිළි වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 30 | සැලූන් | 800 0 | 1,000 0 | 1,250 0 |
| 31 | වීමෝල් | 600 0 | 850 0 | 1,000 0 |
| 32 | වඩුමඩු හා ගෘහභාණ්ඩ වෙළඳසැල් | 750 0 | 1,000 0 | 1,250 0 |
| 33 | ගරාජ් | 750 0 | 1,000 0 | 1,250 0 |
| 34 | ගල්කොරි | 3,000 0 | 3,500 0 | 4,000 0 |

02-18

---

## සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව

2014 වර්ෂයට අදාලව කර්මාන්ත/ව්‍යාපාර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150/152 වගන්ති යටතේ සියඹලාන්ඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයෙහි ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. පී. සමන් වර්ණකුලසූරිය,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 17 වැනි දින,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

*ඉහත කී යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍ර ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත 2014 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි දෙවන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර සියඹලාන්ඩුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

*උපලේඛනය*

| | *I තීරුව*<br>*අදාල වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II තීරුව*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

| *අනු අංකය* | *කර්මාන්ත/ව්‍යාපාර ස්වභාවය* | *2014 වර්ෂය සඳහා*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය (සුළු පරිමාණ මල්පෝච්චි, ගඩොල්) | 2,250 0 |
| 2. | කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය (මහා පරිමාන-ළිං වළලු, කණු,පුටු) | 3,000 0 |
| 3. | යාන්ත්‍රික නොවන වඩුමඩු | 1,500 0 |
| 4. | වැල්ඩින් වැඩපලක් සඳහා (සුළු පරිමාණ) | 2,500 0 |
| 5. | වැල්ඩින් වැඩපලක් සඳහා (මහා පරිමාණ) | 3,000 0 |
| 6. | යාන්ත්‍රික වඩුමඩු | 3,000 0 |
| 7. | උක් ඇඹරුම්හල් | 2,500 0 |
| 8. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන ස්ථාන | 3,000 0 |
| 9. | යන්ත්‍රානුසාරයෙන් කලුගල් කැඩීම | 3,000 0 |
| 10. | වානේ ගෘහ භාණ්ඩ අලෙවිය/නිෂ්පාදනය | 3,000 0 |
| 11. | කිරි එකතු කිරීම හා නිෂ්පාදනය | 1,500 0 |
| 12. | ධාන්‍ය හා කෘෂිකර්ම බීජ වර්ග විකුණන ස්ථාන | 2,000 0 |
| 13. | රෙදිපිළි විකුණන ස්ථාන | 2,000 0 |
| 14. | ගෑස් ගබඩා කරන ස්ථාන | 2,000 0 |
| 15. | ගෘහ භාණ්ඩ අලෙවි කරන ස්ථාන | 2,500 0 |
| 16. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණන ස්ථාන (හාඩ්වෙයාර්/ඔයිල්/තීන්ත වර්ග) | 3,000 0 |
| 17. | ඉන්ධන පිරවුම්හල් | 3,000 0 |
| 18. | මෝටර් රථ අමතර කොටස් අලෙවිය | 3,000 0 |
| 19. | විදුලි උපකරණ/ගුවන් විදුලිය/රූපවාහිනී අළුත්වැඩියාව | 2,000 0 |
| 20. | ධාන්‍ය වර්ග මිලදී ගැනීම | 3,000 0 |
| 21. | රටබීම හල් | 3,000 0 |
| 22. | බීර වෙළඳසැල් | 3,000 0 |
| 23. | ක්‍රීඩා සමාජශාලා | 3,000 0 |
| 24. | ස්වර්ණාභරණ අලෙවිය | 3,000 0 |
| 25. | කළුගල් කඩන ස්ථාන | 3,000 0 |
| 26. | යතුරු පැදි අළුත්වැඩියා කිරීම | 3,000 0 |
| 27. | යකඩ ප්ලාස්ටික් බෝතල් අබලි ද්‍රව්‍ය එකතු කිරීම (මිලදී ගන්නා ස්ථාන) | 3,000 0 |
| 28. | ටයර් ටියුබ් අළුත්වැඩියාව/අලෙවි කිරීම | 2,500 0 |
| 29. | මෝටර් රථ අලුත්වැඩියාව/සර්විස් කරන ස්ථාන | 3,000 0 |
| 30. | වී ඇඹරුම්හල් - ගල් වැලි ඉවත් කරන ලද | 3,000 0 |
| 31. | වී ඇඹරුම්හල් | 3,000 0 |
| 32. | ඉංග්‍රීසි බෙහෙත් හල් | 3,000 0 |
| 33. | ශබ්ද වාහිනී යන්ත්‍ර කුලියට දීම - මහා පරිමාණ | 3,000 0 |
| 34. | ශබ්ද වාහිනී යන්ත්‍ර කුලියට දීම - සුළු පරිමාණ | 1,500 0 |
| 35. | ඡායාරූපශාලා සඳහා | 2,000 0 |

| *අනු. අංකය* | *කර්මාන්ත/ව්‍යාපාර ස්වභාවය* | *2014 වර්ෂය සඳහා රු. ශත* |
|---|---|---|
| 36. | ගව පට්ටි පවත්වාගෙන යාම | 3,000 0 |
| 37. | පැළ තවාන් පවත්වාගෙන යාම (අඹ/ගම්මිරිස්/කුරුඳු) | 1,500 0 |
| 38. | වැලි ගොඩ දැමීම/ප්‍රවාහනය | 3,000 0 |
| 39. | වැලි ගබඩා කර අලෙවි කිරීම | 3,000 0 |
| 40. | මල් ශාලාවක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 41. | පෞද්ගලික පන්ති පවත්වාගෙන යන ස්ථාන | 1,500 0 |
| 42. | පෞද්ගලික මුල්‍ය ආයතන පවත්වාගෙන යාම | 3,000 0 |
| 43. | පෞද්ගලික විදුලිය සපයන ආයතන පවත්වාගෙන යාම | 1,500 0 |
| 44. | දුරකථන සංදේශ කුළුණු | 3,000 0 |
| 45. | ඌරු කොටු පවත්වාගෙන යාම | 1,500 0 |
| 46. | කොන්ත්‍රාත් ආයතන පවත්වාගෙන යාම | 3,000 0 |
| 47. | නවාතැන් පහසුකම් සැපයීම (නිවාඩු නිකේතන) | 3,000 0 |
| 48. | මෝටර් සයිකල්/ට්‍රැක්ටර්/නගුල්/කෘෂි වාහන) අලෙවිය | 3,000 0 |
| 49. | තොග හා සිල්ලර අලෙවි සැල් | 2,000 0 |
| 50. | අවන්හල් | 2,000 0 |
| 51. | පෞද්ගලික සමාගම් (සිංගර්/අබාන්ස්) | 3,000 0 |
| 52. | දුරකථන ඡායා පිටපත් ෆැක්ස් සහ අනෙකුත් පහසුකම් | 2,000 0 |
| 53. | වී ගබඩා කිරීම | 3,000 0 |
| 54. | කාෂිකාර්මික වල් නාශක/කෘමි නාශක/ බීජ වර්ග අලෙවි සැල් | 3,000 0 |
| 55. | ජංගම බේකරි කෑම අලෙවිය - එක් වාහනයක් සඳහා | 1,500 0 |
| 56. | රාජ්‍ය බැංකු සහ පුද්ගලික බැංකු | 3,000 0 |
| 57. | රූපලාවන්‍යාගාර සහ මනාලියන් හැඩ ගැන්වීම | 3,000 0 |
| 58. | විදුලි උපකරණ අලෙවිය | 1,500 0 |
| 59. | දැව ගෘහ භාණ්ඩ අලෙවිය | 2,500 0 |
| 60. | පිත්තල භාණ්ඩ අලෙවිය | 2,000 0 |
| 61. | තාවකාලික වෙළඳ අයිතිය ලබාදීම (මහා පරිමාණ) | 2,000 0 |
| 62. | තාවකාලික වෙළඳ අයිතිය ලබාදීම (සුළු පරිමාණ) | 1,000 0 |
| 63. | සිමෙන්ති ගබඩා  කිරීම හා අලෙවිය | 3,000 0 |
| 64. | රියදුරු පාසල් | 3,000 0 |
| 65. | රථ වාහනවල දුම් පරීක්ෂා කරන ස්ථාන | 3,000 0 |
| 66. | ත්‍රි වීලර් රථගාලක නවතා තබන ත්‍රි රෝද රථයකින් | 1,200 0 |
| 67. | උත්සවශාලා පවත්වාගෙන යන ස්ථාන | 3,000 0 |
| 68. | නිවාස සැලසුම් සකස් කිරීම | 2,000 0 |
| 69. | ස්වයං රැකියා | 1,500 0 |
| 70. | නාමපුවරු ප්‍රදර්ශනය වර්ග අඩියකට | 50 0 |
| 71. | ස්ථිර ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කිරීම | 1,500 0 |
| 72. | දුරකථන සංදේශ කුළුණු (පෙර සවි ගාස්තු උස මීටර්1)ට | 2,000 0 |
| 73. | ක්‍රීඩා පිටිය වෙන් කර දීම සඳහා එක් දිනකට වඩා වැඩි නම් රු. 500 කි. | 1,000 0 |
| 74. | සති පොළ භූමිය හා මාර්ගය දෙපස ප්‍රචාරක වැඩ සටහන්/ප්‍රදර්ශන කුටි දිනකට වැඩි නම් දිනකට රු. 500 0 බැගින් | 1,000 0 |
| 75. | ගල්, වැලි, පස්, ගොබරළු කියුබ් එකක් ප්‍රවාහනය කිරීම සඳහා | 30 0 |

02-210/1

---

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තිය යටතේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයෙහි ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. පී. සමන් වර්ණකුලසූරිය,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 17 වැනි දින,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

*ඉහත කී යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියෙන් සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පලමු තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2014 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ එකී 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු බවටත් එකී වෙළඳ බලපත්‍ර ගාස්තුව 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර සියඹලාන්ඩුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|---|
| 1. | සිල්ලර වෙළඳසැල් - නාගරික | 350 0 | 450 0 | 750 0 |
| 2. | සිල්ලර වෙළඳ සැල් - ග්‍රාමීය | 250 0 | 300 0 | 350 0 |
| 3. | තේ වෙළඳසැල් | 100 0 | 150 0 | 250 0 |
| 4. | හෝටල් | 600 0 | 700 0 | 1,000 0 |
| 5. | බේකරි | 650 0 | 750 0 | 1,000 0 |
| 6. | රසකැවිලි නිෂ්පාදන | 250 0 | 300 0 | 500 0 |
| 7. | යෝගට් හා කිරි මිශ්‍ර ආහාර | 600 0 | 700 0 | 1,000 0 |
| 8. | මත්ස්‍ය හා මාංශ, බිත්තර වෙළඳ | 750 0 | 850 0 | 1,000 0 |
| 9. | එළවළු විකුණන ස්ථාන | 150 0 | 200 0 | 500 0 |
| 10. | ඇඳුම් මසන ස්ථාන | 750 0 | 850 0 | 1,000 0 |
| 11. | සාප්පු බඩු විකිණීම | 500 0 | 600 0 | 1,000 0 |
| 12. | පළතුරු විකිණීම | 200 0 | 250 0 | 500 0 |
| 13. | පාවහන් විකුණන ස්ථාන | 600 0 | 700 0 | 1,000 0 |
| 14. | ඇසුරුම් කරන ලද භාණ්ඩ සිල්ලර/තොග අලෙවිය | 400 0 | 500 0 | 700 0 |
| 15. | පොල්තෙල් මෝල් | 600 0 | 700 0 | 750 0 |
| 16. | ධාන්‍ය වර්ග පැකට් කර විකුණන ස්ථාන | 400 0 | 500 0 | 600 0 |
| 17. | ගමන් මළු නිෂ්පාදනය | 600 0 | 700 0 | 750 0 |
| 18. | යකඩ කම්හල් | 400 0 | 450 0 | 500 0 |
| 19. | පාපැදි අළුත්වැඩියා කිරීම | 350 0 | 400 0 | 500 0 |
| 20. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම | 300 0 | 400 0 | 750 0 |
| 21. | කුළුබඩු හා ධාන්‍ය ඇඹරුම් හල් | 300 0 | 400 0 | 600 0 |
| 22. | බාබර් සාප්පු - නාගරික | 750 0 | 900 0 | 1,000 0 |
| 23. | බාබර් සාප්පු - ගම්බද | 600 0 | 650 0 | 750 0 |
| 24. | සිංහල බෙහෙත් හල් | 350 0 | 400 0 | 500 0 |
| 25. | සිංහල බෙහෙත් ද්‍රව්‍ය ප්‍රවාහනය | 300 0 | 400 0 | 500 0 |
| 26. | බැටරි චාජ් කරන ස්ථාන | 200 0 | 300 0 | 350 0 |
| 27. | උක් පැණි ප්‍රවාහනය | 350 0 | 400 0 | 750 0 |
| 28. | කුෂන් වැඩපල සඳහා | 350 0 | 400 0 | 750 0 |
| 29. | වීඩියෝ, චිත්‍රපට පෙන්වන ස්ථාන | 600 0 | 700 0 | 1,000 0 |
| 30. | වී. සී. ඩී. තැටි අලෙවිය හා කුලියට දීම | 600 0 | 700 0 | 800 0 |
| 31. | ඉලෙක්ට්‍රොනික් බඩු අලුත්වැඩියා කිරීම | 750 0 | 850 0 | 1,000 0 |
| 32. | පරිගනක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 33. | බිම් මල් නිෂ්පාදනය | 300 0 | 350 0 | 400 0 |
| 34. | තේ කොළ වෙළඳාම | 400 0 | 500 0 | 600 0 |
| 35. | කුකුල් කොටු පවත්වාගෙන යාම (කුකුලන් සියයට වැඩි) | 850 0 | 900 0 | 1,000 0 |
| 36. | පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවිය | 750 0 | 800 0 | 1,000 0 |
| 37. | ආට් වැඩපලවල් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 38. | ප්ලාස්ටික් හා ඇලුමිනියම් භාණ්ඩ අලෙවිය | 600 0 | 700 0 | 750 0 |
| 39. | වීදුරු භාණ්ඩ අලෙවිය - ග්ලාස් සෙන්ටර් | 600 0 | 650 0 | 750 0 |
| 40. | ලොතරැයි කුඩු සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 41. | ඉමිටේෂන් භාණ්ඩ සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 42. | පූජා භාණ්ඩ අලෙවි සැල් සඳහා | 600 0 | 700 0 | 800 0 |
| 43. | ග්‍රොසරි | 500 0 | 600 0 | 700 0 |

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|---|
| 44. | විසිතුරු මල් සැකසීම සහ අලෙවිය | 500 0 | 650 0 | 750 0 |
| 45. | ජ්‍යොතිෂ කාර්යාල | 300 0 | 400 0 | 500 0 |
| 46. | දුරකථන අළුත්වැඩියාව | 600 0 | 700 0 | 750 0 |
| 47. | පිඟන් බඩු විකිණීම | 800 0 | 900 0 | 1,000 0 |
| 48. | මිරිදිය/කරදිය මාළු වෙළඳාම | 850 0 | 900 0 | 1,000 0 |
| 49. | ජංගම සිල්ලර වෙළඳාම - වෑන් රථය | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ජංගම සිල්ලර වෙළඳාම - ත්‍රීවිලරය | 150 0 | 250 0 | 500 0 |
| 51. | ජංගම එළවළු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |

02-210/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2014**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| පෙබරවාරි | 2014.02.07 | සිකුරාදා | 2014.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.13 | බ්‍රහස්පතින්දා | 2014.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.21 | සිකුරාදා | 2014.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.28 | සිකුරාදා | 2014.02.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මාර්තු | 2014.03.07 | සිකුරාදා | 2014.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.14 | සිකුරාදා | 2014.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.21 | සිකුරාදා | 2014.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.28 | සිකුරාදා | 2014.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2014.04.04 | සිකුරාදා | 2014.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.11 | සිකුරාදා | 2014.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.17 | බ්‍රහස්පතින්දා | 2014.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.25 | සිකුරාදා | 2014.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.